කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කොරළේ කීරවෙලී පත්තුවේ වරකාපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ මැණික්කඩවර පිහිටි එගොඩහකොටුවවත්ත නම්වූ ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සකසන ලද 1996.08.20 දින හා අංක 1370 දරන පිඹුරේ කැබලි අංක 3 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 28.25 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ඊ 1033/125 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 ඔක්තෝබර් මස 20 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

11-119/1

---

### හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. -බොරලැස්ගමුව ශාඛාව
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සේනානායක විසින් හැටන් නැෂනල් බැංකුව නමට ලියා සහතික කරන ලද්දා වූ, 2005.03.15 දින සහ අංක 1398 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගුරුමුණි මෙත්සිරිලාල් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2008 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම මහ නගර සභා සීමාව තුළ ගොඩිගමුවෙහි පිහිටි රෝහල පාරේ වරිපනම් අංක 59 සි ට අයිති "තනන්කැළේ " නමැති ඉඩමට බලයලලත් මානක පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 3699 සහ 2003.12.05 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1 ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වේ :

*විශාලත්වය :* පර්චස් 6 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.03.28 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය හා* 2008.04..24 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුවේ :

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 01%ක් (සියයට එකක්) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000ක්) ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තුව රුපියල් පන්සියය (රු. 500ක් )ද,
6. සියලුම ප්‍රචාරක වියදම්, ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව වෙත පී.එස්.සී. ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්,) හැටන්- නැෂනල් බැංකුව අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය ෘ 2863121.

11-104/5

---

### ලංකා බැංකුව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.09.05 දිනැති අංක 1566 දරන *ගැසට් පත්‍රයේ*

හා 2008.08.28 දිනැති ඩේලිනිවුස්, දිනමිණ, හා තිනකරන් යන පුවත්පත් වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2008.11.26 වැනි දින පෙ. ව. 11.30 ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

## උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වෙල්ලබොඩපත්තුවේ රත්ගම හි ඉඹුල්ගොඩ පිහිටි අරලියවත්ත නමැති ඉඩමේ බෙදන ලද්දාවූ ලොට් 7 උතුරට : කටුදාම්පේ සිට මාවඩවිල දක්වා පාර ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 9 ද, දකුණට : එම ඉඩමේ ලොට් අංක 8ද, බස්නාහිරටඃ එම ඉඩමේ ලොට් අංක 5 සහ ලොට් අංක 6 ද, මායිම්ව පර්චස් දොළහයි දශම දෙකයි බිංදුවක (අ. 0 රූ. 0 පර්. 12.20) ප්‍රමාණයෙන් යුත් අතර, එහි පිහිටි ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි ද වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 625/157 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එම්. සී. මැන්ඩිස් විසින් සාදන ලද 1988 අගෝස්තු මස 13 දිනැති අංක 667 දරන මැත මිනුම් පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත :

එකී ඉඹුල්ගොඩ පිහිටි අරලියවත්ත නමැති ඉඩමේ එකී අංක 667 දරන පිඹුරේ විස්තර කළ ලොට් 7 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : කටුදාම්පේ සිට මාවඩවිල දක්වා පාර ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 9 ද, දකුණට : එම ඉඩමේ ලොට් 8 සහ 9 ද, බස්නාහිරටඃ එම ඉඩමේ ලොට් 5 සහ 6 ද, මායිම්ව එකී අංක 667 දරන පිඹුර අනුව පර්චස් දොළහයි දශම දෙකයි බිංදුවක (අ. 0 රූ. 0 පර්. 12.20) ප්‍රමාණයකින් යුක්ත වේ.

ඩබ්ලිව්. පී. කෝනාර,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
කිරිබත්ගොඩ.

11-134

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ විකිණීම යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පැන් එෂියා බැංකුවේ මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2008 නොවැම්බර් මස 28 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සීමාව තුළ මහගලබොඩ මීගොඩ දකුණු කෝරළේ වැඋඩවිල්ලි මහකෝවාන ගමෙහි පිහිටි ගල්පොත්තවත්ත නමැති ඉඩමෙහි සර්වේයර් ජෙනරල් සාදන ලද අංක පීපී/පීයූ කේ යූ දරන සැලැස්ම නිරූපිත අංක 118 බිම් කැබැල්ල එකී අංක 118 බිම් කැබැල්ලට මායිම් උතුරට : අංක 1619 දරන සැලැස්මේ කැබලි අංක 88 සහ 87ද, නැගෙනහිරටඃ අංක 1619 දරන සැලැස්මේ කැබලි අංක 119 ද, දකුණට : අංක 1619 දරන සැලැස්මේ 119 ද සහ බස්නාහිරට : අංක 1619 දරන සැලැස්මේ කැබලි අංක 117 සහ එහි ප්‍රමාණය හෙක්ටයාර් දශම දෙකයි එකයි හතරක් (0.214 හෙක්ටයාර්) වේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1849 සහ 2005 දෙසැම්බර් මස 02 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සුකී එන්ටර්ප්‍රයිසස්හි තනි අයිතිකරු පුංචිහේවා කංකානමලාගේ කසුන් දර්ශන දයාරත්න යනුවෙන් ද හඳුන්වන කසුන් දර්ශන දයාරත්න යන අය විසින් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.10.10 වැනි දින ලක්බිම, සුඩර්ඔලි පුවත්පත් සහ ගැසට් පත් ද බලන්න :

*දේපළට පිවිසෙන මාර්ගය* : කුරුණෑගල සිට නුවර මහ පාරේ කිලෝ මීටර් 3.5 ක් ගිය විට මල්ලවපිටිය මංසන්දියෙන් වමට හැරී රිදිගම මහ පාරේ කිලෝ මීටර් 2.6 ක් ගිය විට හමුවන කල්පොත්ත මංසන්දියෙන් වමට හැරී බොරළු පාරේ කිලෝ මීටර් 0.4ක් පමණ ගිය විට අදාළ විකිණීමට ඇති දේපළ හමු වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවෙලෙම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 01% සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 21/2 % ක් ද,
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල පැන් ඒෂියා බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ජේෂ්ඨ කළමනාකරු නීති, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය අංක 450, ගාලු පාර, කොළඹ 03, දුරකථන අංක 2565573/2565565 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

11-104/1

## මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට කෝරළේ, බෙන්තොට පිටිගල නොහොත් ආචාරගොඩ පිහිටි ප්‍රමාණයෙන් අක්. 0 රූ. 3 පර්. 16.3ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලුම දේ, මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත, 2008ක් වූ නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 11.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2003.11.14 දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2003.10.31 වැනි දින දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් යන පුවත්පත් වල වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.* - ගාල්ලේ සිට පිටිගල නගරයට ගොස් එම නගරයෙන් පැලවත්තට යන පාරේ යාර 400ක් පමණ යන විට දකුණු දෙසට ඇති ධර්මධර මාවතේ යාර 300ක් පමණ ගිය විට පාරේ දකුණු පස දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම සමඟ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ 1, අංක 11, ආදිපාද වීදියේ මහජන බැංකුවේ, කලාපීය ප්‍රධාන කාර්යාලයේ (බටහිර 1) සහකාර සමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 2393678, 2387068, ෆැක්ස් අංකය 2435977.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
සාමදාන විනිශ්චයකාර (මුළු දිවයිනටම).

කාර්යාලය : අංක 25 බී බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 011-5756356
නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ,
දුරකථන අංක : 077- 4372293, 2419126.

11-120

## මහජන බැංකුව - නුවරඑළිය නගර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රම්බොඩ කෝරළේ, කුඩා ඔය ග්‍රාමයේ පිහිටි බෙදා වෙන් කළ බිම් කොටසක් වන බලයලත් මිනින්දෝරු බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් මැන සාදන ලද අංක ඒ 3583 හා 1996.10.19 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් ඒ ලෙස ලකුණු කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම් උතුරට, ඇලේ රිසවේසම සහ අඩි පාරද, නැගෙනහිරට- එච්. කේ. හින්නි අප්පු හිමිකම් කියන ඉඩමද, දකුණට- ඇලේ රිසවේසමද බස්නාහිරට වී. ජී. එස් සිංඤෝ හිමිකම් කියන ඉඩමද යන මායිම් ඇතුළත එම පිඹුර ප්‍රකාර රූඩ් තුනකුත් පර්චස් හතයි දශම හතක් (අ0 රූඩ්3, ප7.7) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ .

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2008.11.27 වැනි දින පෙ.ව. 11.00ට දේපල පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ *ගැසට් පත්‍රයේ* 2008.04.25 දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට සහ 208.04.09 දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*- නුවරඑළිය මහනුවර මාර්ගයේ කිලෝ මීටර් 65 කණුව පසු කර මහනුවර දෙසට යාමේදී හමුවන සණස බැංකුව ඉදිරිපස දකුණුපසට ඇති අඩි 20ක තාරපාරේ මීටර් 100ක් පමණ යාමේදී දකුණුපස එම පාර මට්ටමට පහලින් මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුවේ නුවරඑළිය, ප්‍රාදේශීය කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය. දුරකථන අංක 052-2222555 සහ ෆැක්ස් අංක 052-2234757.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. එස්. ලියනගේ- සා. වි.,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු.
තක්සේරුකරු සහ දිවුරුම්ලත් භාෂා පරිවර්තක.

අංක 228/ඒ, "ධම්මිකා"
වලව්වත්ත, කැස්බෑව,
දුරකථන අංක : 94112703478, 0777459823
ෆැක්ස් අංක : 94112703087
11-89

**ඩීඑෆ්සීසී බැංකුව**

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මුල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)
1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

අංක 24557 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිනිගොඩ කෝරළේ, දෙයලදහමුණ පත්තුවේ, පල්ලේ කරඬපොත පිහිටා ඇති දන්ගහපැල නමින් හැඳින්වෙන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඒ. සී. එල්. ජී. අතුකෝරල මහතා විසින් සකසන ල ද 2006 සැප්තැම්බර් මස 10 වැනි දින දරන පිඹුරුපත් අංක 2822 ලොට් අංක C1, සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූඩ්. 0 පර්. 38.05 එහි පිහිටි, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 22 වැනි දිනැති, අංක 24557 දරන උකස්කරය ප්‍රකාර නෙලුන්දෙණියේ "ලක්දීපනී කුමාරි ෆැෂන්ස් " යන සමාගමේ අයිතිකරු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන නෙලුන්දෙණියේ ලේකම්ලාගේ දීපා රානී වරුසප්පෙරුම විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 නොවැම්බර් මස 27 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. රු. 32,400 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද, වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංකය : 011- 2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය:*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011- 2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com

11-94/2

---

**ඩීඑෆ්සීසී බැංකුව**

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මුල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)
1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් සහ යන්ත්‍රෝපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

අංක 76, 02, 407, 969 සහ 1240 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, රත්මල්ගොඩ ග්‍රාමයේ පිහිටි රත්මල්ගොඩ වතුයාය ලෙස හැඳින්වෙන ඉඩමේ (බලයලත් මිනින්දෝරු සහ මට්ටම්කරු W.M පෙරේරා මහතා විසින් සකසන ලද 1975 ඔක්තෝබර් 01 දාතමෙන් යුතු අංක 1449 න් දැක්වෙන පිඹුරු පතෙහි ලොට් 54න් දැක්වෙන උපබෙදීමෙහි) බලයලත් මිනින්දෝරු සහ මට්ටම්කරු ඩී. එච්. ඇතුලත් මුදලි මහතා විසින් සකසන ලද පිඹුරුපත් අංක 874 සහ 1981 නොවැම්බර් 12 වැනි දාතමෙන් යුතු, ලොට් අංක 54ඒ, ලෙස සලකුණ කර බෙදා වෙන් කරන ලද ඉඩම

ඉඩමේ ප්‍රමාණය අක්. 01 රූඩ්. 02 පර්. 00 එහි පිහිටි, ගොඩනැගිලි අන් සියළු දෙය සහ මාර්ග අයිතිය මෙන්ම පහත දැක්වෙන යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් උපකරණ සමග.

*විස්තර.-*

4 1/2" වක්‍රාකාර කියත් කරකවනයකින් යුත් 18" බංකුව සමාන සම්පූර්ණ කරන ලද අශ්ව බල 30 මෝටරය සහ පණගැන්වීමේ උපකරණය

4' වක්‍රාකාර කියත් කරකවනයකින් යුත් 16" බංකුව සමග සම්පූර්ණ කරන ලද අශ්වබල 20 මෝටරය සහ පණ ගැන්වීමේ උපකරණය

2" වක්‍රාකාර කියත් රඳවන 4'x 2" බංකුව (පස් කැපුම් යන්ත්‍රය ) සමග සම්පූර්ණයෙන් සවි කරන ලද අශ්වබල 10 මෝටරය

18" වක්‍රකාර කියත් කරකවනයකින් යුත් බංකුව (ක්‍රොස් කටර් ) සමාන සම්පූර්ණයෙන් කරන ලද අශ්ව බල 5 මෝටරය

16" වක්‍රාකාර කියත් කරකවනයකින් යුත් බංකුව (ක්‍රොස් කටර්) සමාන සම්පූර්ණයෙන් කරන ලද අශ්ව බල 3 මෝටරය පණගැන්වීමේ උපකරණය ක්‍රියාන්විත 5 කින් සමන්විත සර්වත්‍ර ලී වැඩ යන්ත්‍රෝපකරණ

10" ඇඹරුම් යන්ත්‍රය හා සමග සම්පූර්ණයෙන් සවිකරන ලද අශ්වබල 1 මෝටරය සහ පණගැන්වීමේ උපකරණය

5/8" විදුලි උපකරණය

රසායනික පිළියම් යන්ත්‍රය

3/8" විදුම්කරණය සමග රඳවනය

16" ලී සනකම් යන්ත්‍රය

14" ලී මතුපිට සැලසුම් උපකරණය

1" පටු කියත

16" තල ඇඹරුම් යන්ත්‍රය

සූර්ය බලයෙන් වියලන යන්ත්‍රය

දූවිලි ඉවත්කරන යන්ත්‍රය

ඝන අඩි 75 ධාරිතාවෙන් යුත් ලී කාවැද්දීමේ උපකරණය

*විස්තරය.-*

වේලන උඳුන් 02

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රත්න එස්. එම්. ගුණරත්න මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1240 හා 2001.04.27 දින දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එස්. විජේසේකර විසින් සහතික කරන ලද අංක 407 හා 1994.08.15 දින දරන සහ අංක 969 හා 1998.01.13 දින දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එච්. අමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 02 හා 1991.12.02 වැනි දින සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ජෝර්ජ් විසින් ලියා සහතික කරන ලද අංක 76 හා 1988.04.19 දිනැති උකස්කරයන් ප්‍රකාර 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තාවූ ද ලියාපදිංචි කාර්යාලය හොරණ පිහිටා ඇත්තාවූ ද, (මෙහි මින් ඉදිරියට "සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන ) මොඩිෆයිඩ් ටිම්බර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 නොවැම්බර් මස 26 වැනි දින (බදාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පලාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. රු. 35,400 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද, වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංකය : 011- 2440366/77.


ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය:*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011- 2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com


11-94/3

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 රදන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය හා එහි සංශෝධන යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ඩබ්. එම්. ජේ. පී. හුණුකුඹුර මහතා, එච්. එම්. එස්. කේ. කලුහැන්දිවෙල මහත්මිය සහ එල්. පීඕ. ඩී. හර්ෂකුමාර මහතා යන අය විසින් උකස් කරන ලද දේපළ විකිණීම

ණය යොමු අංකය

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදී ජනරජයේ 2008.09.05 දිනැති අංක 1566 දරන ගැසට් පත්‍රයේ හා 2008.09.01 දිනැති දිනමිණ, ඩේලිනිව්ස්, හා තිනකරන් යන පුවත්පත්වල පළකරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනවල විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව්, අංක 474 හි කාර්යාලය ලියාපදිංචි කර ඇති ආර්. එස්. එම්. වෙන්දේසිකාර ආයතනය යන නම යටතේ වෙන්දේසිකරුවන් වශයෙන් ව්‍යාපාර පවත්වාගෙන යන රංජිත සිරිවර්ධන මහානාම මහතා, ක්‍රිෂාන් සිරිවර්ධන මහනාම මහතා, දිනාලි වීරත්තිකා ඩයස් මිය, ඩුලිප් හේමාල් චින්තක සිරිවර්ධන මහානාම සහ දුනිකා මංජුලී සිරිවර්ධන මිය යන අයවලුන් විසින් 2008.12.06 හා 2008.12.13 යන දිනයන්හි දී එක් එක් දේපලට ඉදිරියෙන් සඳහන් කර ඇති වේලාවන්හි දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### පළමු වැනි උපලේඛනය

දේපල 1 : 2008.12.06 වැනි දින පෙ. ව. 10.00 ට.

වයඹ පළාතේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වේඋඩවිල්ලි හත්පත්තුවේ කුඩාගල්බෝඩ කෝරළයේ, කුරුණෑගල මහ නගර සභා සීමාවේ බමුණුගෙදර හි පිහිටි ලේක්සයිඩ් එස්ටේට් හෙවත් ලේක් රවුන්ඩ් එස්ටේට් නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජේ. එල්. චන්ද්‍රරත්න විසින් සාදන ලද 1962 අගෝස්තු මස 24 දිනැති අංක 2064 දරන පිඹුරේ ලොට් 4 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : වැව රවුම පාරද ද, නැගෙනහිරට : දැන් එක දේපලක් කර ඇති ලොට් 5, 6 සහ 7 වර්තමානයේ ඒ. බී. එම්. ද අල්විස් කරුණාරත්න මහතාට අයිති දේපල ද, දකුණට : වැව ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 3 දැන් කැරොලයින් ප්‍රනාන්දු මහත්මියට අයිති ඉඩම ද, මායිම්ව පර්චස් තිස්හතරක (අ. 0 රූ. 0 පර්. 34) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි සහ සියලු දේ වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ශීර්ෂ ඒ 1161/273 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එම්. බී. කලවානේගම විසින් සාදන ලද 1994 නොවැම්බර් මස 29 දිනැති අංක 927 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැන් විස්තර කර ඇති ඉඩම් කැබැල්ල, මැත මිණුමේ දැන් වැව පාර, වරිපනම් අංක 7 දරන එකී පිඹුර අනුව උතුරට : වැව රවුම පාර ද, නැගෙනහිරට : අංක 2064 දරන පිඹුරේ ලොට් 5, සහ 7 ද, දකුණට: කුරුණෑගල ටැංකිය ද, බස්නාහිරට : අංක 2064 දරන පිඹුරේ ලොට් 3 ද, මායිම්ව පර්චස් තිස්හතක (අ. 0 රූ. 0 පර්. 37) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ.

දේපල II : 2008.12.06 වැනි දින පෙ. ව. 11.30 ට.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වේඋඩවිල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළයේ කුරුණෑගල මහ නගර සභා සිමාවේ ටැංකි වටරවුම පාරේ පිහිටි ලේක්සයිඩ් එස්ටේට් නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එල්. චන්ද්‍රරත්න විසින් සාදන ලද 1960 දෙසැම්බර් 21 දිනැති අංක 1731 දරන පිඹුරේ විස්තර කළ ලොට් 10 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ලේ බෙදන ලද්දාවූ කොටස ටැංක වටරවුම පාර මැද සිට අඩි 30ක් වූ ගිනිකොණ මායිම ලොට් 10 වශයෙන් සඳහන් එකී ඉඩම් කැබැල්ල ද, නැගෙනහිර මායිමේ සිට ලොට් 10 වශයෙන් සඳහන් එකී ඉඩම් කැබැල්ලේ බස්නාහිර දෙසට අඩි එකක් ද, උතුරට, නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ද, මායිම්ව පර්චස් එකක (අ. 0 රූ. 0 පර්. 01) ප්‍රමාණයෙන් යුක්ත වේ. එකී ඉඩම ඒ 1126/142 හි ලියාපදිංචි කර ඇති අතර ටැංකි වටරවුම පාරේ සිට එකී ඉඩමට මාර්ග අයිතිය ද වේ.

බලයලත් මිනින්දෝරු ජේ. එල්. චන්ද්‍රරත්න විසින් සාදන ලද 1960 දෙසැම්බර් මස 21 දිනැති අංක 1731 දරන පිඹුරේ ලොට් 10 බී වශයෙන් විස්තර කර ඇති එකී බෙදන ලද්දාවූ කොටස බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් සාදන ලද 1987 ඔක්තෝබර් මස 16 දින උප බෙදුමක් වන උතුරට : ලොට් 10ඒ වශයෙන් විස්තර කළ එම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : ලොට් 10 ඒ වශයෙන් විස්තර කළ එම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : ලොට් 10 ඒ වශයෙන් විස්තර කළ එම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : ලොට් 10 ඒ වශයෙන් විස්තර කළ එම ඉඩමේ ඉතිරි කොටස ද, මායිම්ව පර්චස් එකකින් (අ. 0 රූ. 0 පර්. 01) යුක්ත වේ.

### දෙවැනි උපලේඛනය

දේපල : III 2008.12.06 වැනි දින ප. ව. 2.00 ට.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වේඋඩ විල්ලිහත්පත්තුවේ, කුඩාගල්බොඩ කෝරළයේ, බමුණුගෙදර හි පිහිටි ලේක්සයිඩ් එස්ටේට් නැමැති ඉඩමේ කුරුණෑගල බමුණුගෙදර පාර, වරිපනම් අංක 10/5 දරන බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1985 නොවැම්බර් මස 16 දිනැති අංක 253/85 දරන පිඹුරේ විස්තර කළ ලොට 6ඒ වශයෙන් සඳහන් බෙදනලද්දාවූ ඉඩම් කැබැල්ල, උතුරට: අංක 1731 දරන පිඹුරේ අඩි 15ක පාරක් වූ ලොට් 4 ද, නැගෙනහිරට: බලයලත් මිනින්දෝරු ජේ. වී. පෙරේරා විසින් සාදන ලද අංක 1731 දරන බෙදුම් පිඹුරේ ලොට් 5 ද, දකුණට : එකී අංක 253/85 දරන පිඹුරේ ලොට් 6 බී ද, බස්නාහිරට : අඩි 15 ක පාරක් වූ එකී අංක 253/85 දරන පිඹුරේ ලොට් 6 ඩී ද, මායිම්ව පර්චස් පහළොවක (අ. 0 රූ. 0 පර්. 15) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි සහ සියලු දේ සමග අංක 1731 දරන පිඹුරේ ලොට් 4 වශයෙන් විස්තර කල පාර පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතිය හා අංක 253/85 දරන පිඹුරේ ලොට් 6 ඩී වශයෙන් සඳහන් පාරේ අයිතිය ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ශීර්ෂ ඒ 1097/141 හි ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

දේපල IV 2008.12.06 වැනි දින ප. ව. 4.00 ට.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ. වේලඩවිල්ලි හත්පත්තුවේ කුඩාගල්බොඩ කෝරළයේ බමුණුගෙදර හි පිහිටි ලේක්සයිඩ් එස්ටේට් නැමැති ඉඩමෙන් කුරුණෑගල බමුණුගෙදර පාර, වරිපනම් අංක 10/7, දරන බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1985 නොවැම්බර් මස 16 දිනැති අංක 253/85 දරන පිඹුරේ විස්තර කළ ලොට් 6 සී වශයෙන් සඳහන් බෙදනලද්දාවූ ඉඩම් කැබැල්ල, උතුරට: ලොට් 6 ඩී සහ ලොට් 6 බී ද, නැගෙනහිරට : අංක 1731 දරන පිඹුරේ ලොට් 05 ද, දකුණට : අංක 1731 දරන පිඹුරේ ලොට් 09 සහ ලොට් 10 ද, බස්නාහිරට : අංක 25385 දරන පිඹුරේ ලොට් 7 සී ද, මායිම්ව පර්චස් : දහනවයක (අ. 0 රූ. 0 පර්. 19) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි හා පිහිටි සියලු දේ සමග අංක 1731 දරන පිඹුරේ ලොට් 4 වශයෙන් විස්තර කළ පාර පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතිය හා අංක 253/85 දරන පිඹුරේ ලොට් 6ඩී වශයෙන් සඳහන් පාරේ අයිතිය ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ශීර්ෂ ඒ 1095/290 යටතේ ලියාපදිංචි කර ඇත.

### පළමුවැනි උපලේඛනය

දේපල V: 2008.12.13 වැනි දින පෙ. ව. 11.00 ට,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේපත්තුවේ තලංගම දකුණේ පිහිටි බටපොත පාර වරිපනම් අංක 7/26, දරන තන්ත්‍රියවත්ත වලව්වේවත්ත හෙවත් නුගගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් සාදන ලද 1993 අගෝස්තු මස 04 දිනැති අංක 1273 දරන පිඹුරේ ලොට් 1 සහ 1993 අගෝස්තු මස 12 දිනැති අංක 1281 දරන පිඹුරේ ලොට් 'ඒ' හි ඒකාබද්ධ කරන ලද උප බෙදුමක් වූ) බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් සාදන ලද 1993 අගෝස්තු මස 23 දිනැති අංක 1283 දරන පිඹුරේ විස්තර කළ ලොට් 8 වශයෙන් සඳහන් බෙදන ලද හා නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට : බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් සාදන ලද (1993.03.02 දිනැති ඔප්පුව අනුව) බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් සාදන ලද 1993 අගෝස්තු 04 දිනැති අංක 1268 දරන පිඹුරේ ලොට් 4 බී ද, නැගෙනහිරට : 1993 අගෝස්තු 04 දිනැති අංක 1258 දරන පිඹුරේ ලොට් 4 බී සහ 1993 ජූනි මස 21 දිනැති අංක 1288 දරන පිඹුරේ ලොට් ඊ ද, (වෙන්කළ පාර) දකුණට : එම ඉඩමේ ලොට් 12 (මීටර 4.5 පළල පාර) ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 7 ද, මායිම්ව එකී අංක 1283 දරන පිඹුර අනුව පර්චස් දහයයි දශම එකයි නවයක (අ. 0 රූ. 0 පර්. 10.19) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ වැවිලි සහ පිහිටි සියලු දේ වේ. මෙය ජී 938/191 හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

(අ) එකී දකුණේ තලංගම හි පිහිටි තන්ත්‍රියාවත්ත වලව්වේවත්ත හෙවත් නුගගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල විසින් සාදන ලද 1993 අගෝස්තු මස 23 දිනැති එකී අංක 1283 දරන පිඹුරේ ලොට් 12 වශයෙන් සඳහන් බෙදන ලද ඉඩම් කැබැල්ල උතුරටः අංක 1268 දරන පිඹුරේ ලොට් 6, 7 සහ 8 සහ ලොට් 4 ඩී ද, නැගෙනහිරටः එකී අංක 1268 දරන පිඹුරේ ලොට් 4 ඩී සහ ලොට් ඊ ද, දකුණටः ලොට් 11 , 9 සහ ලොට් ඊ ද, බස්නාහිරට : ලොට් 11 ද, මායිම්ව එකී අංක 1283 දරන පිඹුර අනුව පර්චස් අටයි දශම බිංදුවයි හතරක (අ. 0 රූ. 0, පර්. 8.04) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ජී. 938/192 හි ලියාපදිංචි කර ඇත.

(ආ) එහි තලංගම දකුණේ පිහිටි තන්ත්‍රියාවත්ත වලව්වේවත්ත හෙවත් නුගගහවත්ත නැමැති ඉඩමේ එකී අංක 1283 දරන පිඹුරේ ලොට් 13 වශයෙන් සඳහන් බෙදන ලද ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 14, 15 සහ 16 ද, නැගෙනහිරට : පාර ද, දකුණට ලොට් ජේ සහ බස්නාහිරට : අංක 1258 දරන පිඹුරේ ලොට් ඊ ද, මායිම්ව එකී අංක 1283 දරන පිඹුර අනුව පර්චස් හයයි දශම එකයි බිංදුවක (අ. 0 රූ. 0 පර්. 6.10) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ජී. 938/193 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. සිල්වා,
සම්බන්ධතා කළමනාකරු,
අයකර ගැනීම් ආයතනික.

අයකරගැනීමේ ඒකකය,
3 වැනි මහල,
ලංකා බැංකුව, ප්‍රධාන කාර්යාලය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

11-135

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

සෙලාන් මර්චන්ට් බැන්ක් ලිමිටඩ්
අංක 69, ජනාධිපති මාවත,
කොළඹ 01.
දැන්
අංක 385, ලැන්ඩ් මාර්ක් බිල්ඩිං
ගාලු පාර,
කොළඹ 03.

..........................පැමිණිලිකරු

නඩු අංකයः එච්. සී.
සිවිල් 39/2005/(1)

එදිරිව

1. ප්‍රින්ට් වර්ල්ඩ් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 381, දුම්රියපල පාර,
කටුනායක.

2. හිඹුටුගොඩ හේවාගේ සිසිර කුමාර
සමරසේකර
අංකः 3, විමුක්ති මාවත,
පැලවත්ත
බත්තරමුල්ල.

..........................විත්තිකරුවන්

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව ඉහත කී 1 වන හා 2 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට රු. 4,158,410.78 ක මුදලක් හා රු. 2,125,186.27 ක මුදලක් මත 2005.01.01 වැනි දින සිට තීන්දු ප්‍රකාශ දින තෙක් වර්ෂයකට 31% බැගින් වැඩිදුරටත් වන පොලිය හා ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොළිය ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ. තව ද 1 වැනි හා 2 වැනි විත්තිරුවන් විසින් පැමිණිලිකරුට මෙම අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ගෙවිය යුතු බවට ද, නියෝග කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ. 2006.08.24 වැනි දින දෙන ලද තීන්දු ප්‍රකාශයට අනුව විත්තිකරුවන් එම ගෙවීම පැහැර හැර ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් දේපල 2008 ක්වූ දෙසැම්බර් මස 01 වැනි දින පෙ. ව. 11.00 ට පහත උපලේඛනයේ ඇති ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 07, තලංගම දකුණ කොටසේ පිහිටි වර්තමානයේ වරිපනම් අංක 4/3 එම්. ඩී. එච්. නිවාස සංකීර්ණයේ ජී. බී. දොඩංවල බලයලත් මිනින්දෝරු විසින් මැන සාදන ලද 1993.04.19 දින සහ අංක 719 දරන පිඹුරේ දැක්වෙන පෙලකැකුණවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 100ඒ දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරටः පාර ද, නැගෙනහිරටः ජාත්‍යන්තර පාසැල ද, දකුණටः ලොට් 100 බී ද, බස්නාහිරටः අඩි 15 පළල පාර ද, මායිම් වූ එකී අංක 719 දරන සැලැස්මේ ප්‍රකාරව පර්චස් එකොළහයි දශම හතයි පහක් (අ 0. රූ. 0, පර්. 11.75 ) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 212/120 හි ලියාපදිංචි කර ඇත.

*ඉඩමට පිවිසීම.-* බත්තරමුල්ල පන්නිපිටිය පාරේ, 2Km පමණ ගිය විට පාලම් 3 හංදිය හමු වේ. එතැන් සිට 800m පමණ ගිය විට වම් දෙසින් එම්. ඩී. එච්. පුරය හෙවත් විමුක්ති මාවත හමු වේ. විමුක්ති මාවතේ 100m පමණ ඉදිරියට ගිය විට පාරට මායිම්ව දකුණු පස මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය :*

1. වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ද,
2. නොතාරිස් ගාස්තු,
3. ගමන් ගාස්තු,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු
5. රජයේ ගාස්තු
6. වෘත්තීමය ගාස්තු වශයෙන් 2 1/2% ක් ද,
7. වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු ය.
8. ඉතිරි මුදල වන 75% දින 30 ඇතුළත දී කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කල යුතුය.
9. සියළුම ප්‍රචාරක වියදම් ද ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු,
බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය,
බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 99, උසාවිය පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 2445393.

ලිවේරා ඇසෝසියේට්ස්,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ,
ෂබරි උද්‍යානය,
කොළඹ 04.

දුරකථන අංක : 2584622,
2592872 - 3.

11-121

## මහජන බැංකුව
(ආයතිනික බැංකු අංශය)

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරණ මහජන බැංකු පනතෙහි 29ඩී වන වගන්තිය යටතේ විකිණීම

*පළමු විකිණීම*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොල ලියාපදිංචි කොට්ඨාශයේ කඳුකර ඉහළ කෝරළේ උඩපළාතේ පුපුරැස්ස ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවික්‍රම මහතා විසින් සකස් කරන ලද 1984 අප්‍රේල් 22, 23, හා මැයි 26 දාතමින් යුතු අංක 895 පිඹුරු පතෙහි ලොට් අංක 01 වශයෙන් දක්වා ඇති ඉඩම් කට්ටිය සමග එහි පිහිටා ඇති පුපුරැස්ස තේ කර්මාන්ත ශාලාව යන නමින් හැඳින්වෙන තේ කර්මාන්තශාලාව ද, ඉඩමේ ප්‍රමාණය : අක්. 00 රූඩ්. 03 පර්. 25.75 එහි පිහිටි සියළු ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ සහ වැව්ලි ද සමග

*යන්ත්‍රෝපකරණ විස්තර :*

| *අයිතම* | *ගණන* | *විස්තරය* |
|---|---|---|
| 01 | 01 | අමු තේ දළු ඔසවනය අශ්වබල 3 මෝටරය සහ පණගැන්වීමේ උපකරණය (බ්‍රිතාන්‍යයේ සාදන ලදී) |
| 02 | 03 | 126' X 5' (සතුන්ගේ ) කැම ඔරුව අශ්වබල 10 මෝටරය මිනිත්තුවට භ්‍රමණ 960 සහ දේශීය නිෂ්පාදිත පණ ගැන්වීමේ උපකරණය) |
| 03 | 06 | ඇඹරුම් යන්ත්‍ර සමග අශ්වබල 20 මෝටරය සහ පණගැන්වීමේ උපකරණය |
| 04 | 03 | රෝලර් බ්‍රෝකර්ස් සමග මෝටරය සහ පණගැන්වීමේ උපකරණය |
| 05 | 01 | ආර්ද්‍රතාව පාලනය කිරීමේ උපකරණය |
| 06 | 01 | අඩි 4 වේලන උපකරණය සියළු උපාංග සහිතව සහ උඳුන සමග අශ්ව බල 10 මෝටර් රථ සහ පණගැන්වීමේ උපකරණය CCC |
| 07 | 01 | අඩි 6 වේලන උපකරණය සියළු උපාංග සහිතව සහ උඳුන සමග අශ්ව බල 20 මෝටරය සහ පණගැන්වීමේ උපකරණය CCC |
| 08 | 02 | අයි. ඩී. විදුලි පංකා සමග අශ්වබල 2 මෝටරය මිනිත්තුවට භ්‍රමන 1400 සහ පණගැන්වීමේ උපකරණය (දේශීය නිෂ්පාදිත) |
| 09 | 01 | ජම්බෝ ඇහිඳීමේ යන්ත්‍රය සහ අශ්ව බල 2ක් මිනිත්තුවට භ්‍රමණ 1400 (දේශීය නිෂ්පාදිත) |
| 10 | 01 | කෙඳි නිසියාකාරව හා සමග උණුසුම් කිරීමේ විදුලි බුබුළු 12ක් අශ්වබල 1.5 මෝටරය මිනිත්තුවට භ්‍රමණ 14.15 සහ ඉන්දියාවේ නිෂ්පාදිත පණගැන්වීමේ උපකරණය |
| 11 | 01 | මිඩෙල්ටන් ද්විත්ව ක්‍රියාකාරී බන්දේසි සමග අශ්ව බල 2 මෝටරය මිනිත්තුවට භ්‍රමණ 1400 සහ පණගැන්වීමේ උපකරණය |
| 12 | 1 | චුරංග කුල්ල සහ අශ්ව බල 3 මෝටරය සහ පණගැන්වීමේ උපකරණය භ්‍රමණ මි. 1420 දේශීය නිෂ්පාදිත) |
| 13 | 01 | චුෂණ කුල්ල අශ්ව බල 5.5 මෝටරය මි. භ්‍රමණ 1440 සහ පණගැන්වීමේ උපකරණය |
| 14 | 01 | මිඩෙල්ටන් එක අතට ක්‍රියාකරන බන්දේසි 3ක් සහ අශ්ව බල 2 මෝටරය මි. භ්‍රමණ 1400 සහ පණගැන්වීමේ උපකරණය සමග එහා මෙහා ගෙනයන පටිය |

| අයිතමය | ගණන | විස්තරය |
|---|---|---|
| 15 | 01 | මිඩෙල්ටන් ද්විත්ව ක්‍රියාකාරී 2ක් සමග අශ්ව බල 1.5 මෝටරය මි. භ්‍රමණ 1400 |
| 16 | 01 | චුෂණ කුල්ල අශ්ව බල 2 මෝටරය සහ පණගැන්වීමේ උපකරණය මිනිත්තුවට භ්‍රමණ 1425 සී. සී. සී. |
| 17 | 01 | චුෂක පංකාව සහ මෝටරය අශ්ව බල 1.5 මි. 1420 බ්‍රිතාන්‍ය සාදන ලද |
| 18 | 01 | මිච් තනි බන්දේසිය අශව බල 1 මෝටරය සහ මී. භ්‍රමණ 945 පණගැන්වීමේ උපකරණය (වෝකර්ස්) |
| 19 | 01 | මිච් තනි බන්දේසිය අශ්ව බල 2 මෝටරය මි. භ්‍රමණ 1400 සහ පණගැන්වීමේ උපකරණය |
| 20 | 01 | චෝටා සහ බන්දේසි අශ්ව බල 1.5 මෝටරය මි. භ්‍රමණ 930 සහ පණගැන්වීමේ උපකරණය සමග එහාමෙහා ගෙනයන පටියේ (දේශීය නිෂ්පාදිත) |
| 21 | 01 | චෝටා බන්දේසි 4, අශ්ව බල 3 මෝටරය භ්‍රමණ 940 සමග දේශිය නිෂ්පාදිත එහාමෙහා ගෙනයන පටිය |
| 22 | 01 | මිච් සිෆ්ටර් බන්දේසි අශ්ව බල 2 මෝටරය මි. භ්‍රමණ 1400 සහ එහා මෙහා ගෙන යන පටිය (දේශිය නිෂ්පාදිත) |
| 23 | 01 | එංගලන්තයේ වයිට්මන් සමාගමෙහි නිෂ්පාදිත ගස් කපන යන්ත්‍රය සහ මෝටරය ගියරය පෙට්ටිය සහ පණ ගැන්වීමේ උපකරණය |
| 24 | 01 | පෙකෝ තේ ගස් කපන යන්ත්‍රය මෙය එංගලන්තයේ සැවේජ් සමාගමේ නිෂ්පාදනයකි. අශ්බව 0.5 ගියර් සහිත මෝටරය සහ පණගැන්වීමේ උපකරණය |
| 25 | 01 | ටෙරි අඩුව ගියර් සහිත මෝටරය අශ්වබල 0.5 සහ පණගැන්වීමේ උපකරණය සී සී.සී |
| 26 | 01 | බලයෙන් ක්‍රියාකරන බර කිරණ තරාදිය (ඇවරි) 2115 වර්ගයේ බ්‍රිතාන්‍යයේ නිෂ්පාදිත |
| 27 | 01 | වර්ණ විභේදනය ජපානයේ නිෂ්පාදිත සෙන්වෙක් සී 8300 වර්ගය සහ වායු සම්පීඩන වර්ගය අංක එන් 10-ඊ7.5 කේ. ඩබ්ලිව්. මෝටරය සහ පණගැන්වීමේ උපකරණය |
| 28 | 06 | පණ ගැන්වීමට භාවිතා කරන මේස වානේ රාමු කට්ටුව සමග රාක්කය |
| 29 | යුගල | ඉරන මෝල සමග කපන උපකරණ 2යි අශ්ව බල 30 සහ කිලෝවොට් 7.5 මෝටර සහ පණගැන්වීමේ උපකරණය සමාන මේසය |
| 30 | 01 | ලී කැබලි කරන පොරොව |
| 31 | 01 | ලී කපන උපකරණ |
| 32 | 01 යුගල | මෙවලම් උපාංග සම්බාධකල නිස්සාරක |

*විදුලි බලය* .- කිලෝ වොල්ට් ඇම්පියර් (KVA) 250 ට්‍රාන්ස්පෝමරය හා විදුලි රැහැන් සවිකර ඇත විදුලිය බෙදාහරින පද්ධතිය හා සමග ප්‍රවාහන පාලක පුවරුවල මාරුකල හැකි ස්විචය සහ පීපථ කාඩනය

(*a*) අමතර විදුලිජනක, කැටපිලර් යන්ත්‍රය කේ. වී. ඒ. 262 මී. භ්‍රමණ 150 මී. 343 සී ඇෆ් 0.8 මාර්ග SRCR සහ වර්ගයේ අංකය 200 වී හි 271

(*b*) ගිල්ක්ස් ලැක්ෂයර් විදුලිටර්බියන පද්ධතිය KVA 90 ඩයිනමෝව - මී. භ්‍රමණ 1500

*ජල සැපයුම*. - කර්මාන්ත ශාලාවට සහ නිවෙස්වලට ජල පහරෙන් සැපයෙන බෙදාහරින ඉහල සවිකර ඇති මාර්ග පයිප්ප සහ සවිකරන උපරකණ

*සන්නිවේදක*.- කර්මාන්තශාලාවට දුරකථන මාර්ග දෙකක් ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 නොවැම්බර් මස 24 වැනි සඳුදා දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එදිනම ප. ව. 3.30 ට 2 වන විකිණීම.

මධ්‍යම පළාතේ, මහනුවර ආදායම් දිස්ත්‍රික්කයේ සහ ගම්පොළ ලියාපදිංචි දිස්ත්‍රික්කය තුළ ගඟ ඉහළ කෝරළයේ උඩ පළාතේ උලපනේ ප්‍රදේශයේ පිහිටි රාජා ඇල වත්ත වශයෙන් හැඳින්වෙන සියළු වතු වැවිලි සහ පරිශ්‍රයේ මහනුවර මිනුම් අධිකාරී තැන විසින් 1974 ජුනි සහ ජූලි දාතමින් යුතුව දැක්වෙන (LRC මත/196/මත/1, මත 244/ මත/3/245/මත/1සහ මත/24/මත/5) ලොට් අංක 3 ලෙස සලකුණු කර ඇති ඉඩමේ කොටසක් වූ බලයලත් මිනින්දෝරු එස්. එම්. අබේරත්න මහතා විසින් සකසන ලද 1987 ජුනි 11 සහ 14 දාතමින් යුතු අංක 30 දරන පිඹුරෙහි ලොට් A, B, C, D. E, F. G, H දරන පිඹුර මගින් සලකුණු කර ඇති සියලු විශේෂිත සහ බෙදාවෙන් කරන ලද ඉඩම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය අක්. 39 රූ. 0 පර්. 0

ලියාපදිංචි අංකය එම් එෆ්/1082 දරන තේ කර්මාන්තශාලාව ඉහත කර්මාන්තශාලාවේ ඇති සහ භාවිතා කරන යන්ත්‍රෝපකරණ සවිකරන ලද භාණ්ඩ සවිකරන උපාංග මෙවලම් සහ උපකරණ සහ බංගලාව අනෙකුත් ගොඩනැගිලි පිටත නිවාස තේ වැවිලි අනෙකුත් වැවිලි සහ අන් සියලු දේ සමග.

**යන්ත්‍රෝපකරණ විස්තර**

| අයිතමය | ගණන | විස්තරය |
|---|---|---|
| 01 | 08 | ඇඹරුම් යන්ත්‍රය සමග අශ්ව බල 20 මෝටර් සහ පණගැන්වීමේ උපකරණ |
| 02 | 03 | ඇඹරුම් කඩනය සමග මෝටර් සහ පණගැන්වීමේ උපකරණය |
| 03 | 01 | අඩි 4 වේලනය යන්ත්‍රය සමග සියලු සවිකරන උපාංග සහ උඳුන |
| 04 | 01 | අඩි 5 වේලන යන්ත්‍ර උපාංග සමග උඳුන |
| 05 | 06 | පැසවීමට භාවිතා කරන මේස |
| 06 | 02 | ජම්බෝ ඇහිදීමේ යන්ත්‍රය සමග මෝටර් සහ පණගැන්වීමේ උපකරණය |
| 07 | 01 | ස්ටෝක් නිස්සාරකය සමග මෝටරය සහ පණගැන්වීමේ උපකරණය |
| 08 | 03 | මිඩෙල්ටන් පරීක්ෂණය සමග මෝටර් සහ පණගැන්වීමේ උපකරණය |
| 09 | 02 | චෝටා පරිසණකය සමග මෝටර් සහ පණගැන්වීමේ යන්ත්‍රය |
| 10 | 01 | විද්‍යුත් වර්ණ විභේදනය සෙන්ච් R 8400 වර්ගය |
| 11 | 01 | එහාමෙහා යන පටි යුගල සමග මෝටරය සහ පණගැන්වීමේ උපකරණය |
| 12 | 01 | විද්‍යුත් බර කිරුම් යන්ත්‍රය |
| 13 | 01 | කුල්ල සමග මෝටරය සහ පණගැන්වීමේ උපකරණය |
| 14 | 01 | තේ ඇඹරුම් යන්ත්‍රය සමග එහාමෙහා පටි මෝටරය සහ පණගැන්වීමේ උපකරණය |
| 15 | 01 | මලු මරු කිරීමට යොදන තනි පීල්ල |

| *අයිතමය* | *ගණන* | *විස්තරය* |
|---|---|---|
| 16 | 05 | අඩි 100 සතුන්ගේ ආහාර දමන ඔරු |
| 17 | 01 | අඩි 90 සතුන්ගේ ආහාර දමන ඔරුව |
| 18 | 02 | ලී කැබලි කරන පොරොව |
| 19 | 01 | ලී කපන උපකරණය |
| 20 | 01 | ලොට් මෙවලම් අමතර කොටස් සම්බාවිත උපකරණ සහ නිස්කරුක |

*විදුලි බල සැපයුම.-* ප්‍රධාන මාර්ගයේ සිට කර්මාන්තශාලාවට ඉහළ විදුලි රැහැන් KVA 250 ට්‍රාන්ස්පෝමරය විදුලි උප පොලේ සිට ඇද තිබේ. ලංකා විදුලි බල මණ්ඩලය මගින් විදුලිය බෙදා හරින පද්ධතියේ සැපයෙන විදුලිය සමග පාලන පුවරුව සහ පේනු උපකරණ සහ ටොෂිබා වර්ග අංක 90050 GAGIB KVA 170 අමරත විදුලි ජනකය .

*ජල සැපයුම.* - ජල පහරෙන් ජලය බෙදා හැරීමේ පද්ධතිය හා සමග ඉහළින් සවිකර ඇති ජල ටැංකි.

*සන්නිවේදනය* .- ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන රැහැන් 03ක් ප්‍රධාන මාර්ගය 1 සිට කර්මාන්ත ශාලාවට ඇද තිබේ.

2008 නොවැම්බර් මස 26 වැනි බදාදා දින ප. ව. 3.30 ට පිහිටි ස්ථානයේදී.

**විකිණීම 3**

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභා පරිපාලනයේ සීමාවේ මහවත්ත කොට්ඨාසයේ අංක 03 හි වරිපනම් අංක 166 නාගලගම් වීදියේ පිහිටා ඇති බලයලත් මිනින්දෝරු එන්. එම්. ආර්. ප්‍රේමරත්න මහතා විසින් සකසන ලද 1990 දෙසැම්බර් මස 30 දාතමින් යුතු වරිපනම් අංක 124 දරන පිඹුරු පතෙහි ලොට් අංක 01 වශයෙන් දක්වා ඇති සියලු බෙදා වෙන්කිරීම් කල සහ අර්ථකථන නිරූපණය කර ඇති ඉඩම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූ. 0 පර්. 20.85.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2008 ඔක්තෝබර් මස 10 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2008 සැප්තැම්බර් මස 29 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස්, තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පලාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

විකුණුම් මිළෙන් ඉතිරි 90%ක් විකුණූ දින සිට දින 30ක් ඇතුළත ජ්‍යෙෂ්ඨ කළමනාකරු මහජන බැංකුව ආයතනික බැංකු අංශය අංක 35 ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 ට ගෙවිය යුතුය.

දුරකථන අංකය : 011- 2437239 ෆැක්ස් අංකය : 011-2334262.

යථෝක්ත ලිපිනයෙන් අදාල ඔප්පු සහ අනිකුත් විස්තර ලබාගත හැකි ය. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10%ක මුදල බැංකුව සන්තක කිරීමේ සහ දේපල නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලයඃ*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011- 2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

11-93

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතුයි.
5. සියලුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි.

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණන ගැසට් පිටුවකටම | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ)

11. සෑම සිකුරාදා දියකටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි
13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව (-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | පිටරට |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වැනි ඡේදය | 520 0 | 1,007 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 9 |
| III වැනි ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව | තැපැල් (මෙරට: |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| (අ) | I වැනි කොටස | 31 0 | 5 0 |
| | II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 0 | 5 0 |
| (ආ) | I වැනි ඡේදය | 10 0 | 5 0 |
| | II වැනි ඡේදය | 12 0 | 5 0 |
| | III වැනි ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05 පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## *උපලේඛනය*

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2008** | | | |
| නොවැම්බර් | 2008.11.07 | සිකුරාදා | 2008.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.11.14 | සිකුරාදා | 2008.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.11.21 | සිකුරාදා | 2008.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.11.28 | සිකුරාදා | 2008.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2008.12.05 | සිකුරාදා | 2008.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.12.11 | බ්‍රහන්පතින්දා | 2008.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.12.19 | සිකුරාදා | 2008.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.12.26 | සිකුරාදා | 2008.12.11 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | | | **2009** | | | |
| ජනවාරි | 2009.01.02 | සිකුරාදා | 2008.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.09 | සිකුරාදා | 2008.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.16 | සිකුරාදා | 2009.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.23 | සිකුරාදා | 2009.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.30 | සිකුරාදා | 2009.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්‍ෂමන් ගුණවධිk"**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.